සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

**07 | S | I, II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (07) ඉතිහාසය - I, II

පැ තුනයි

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ඉතිහාසය - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට පිළිතුරු ලිවීමට ලබාදෙන පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක 1 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

1. මහාවංසය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) පාහියන් හිමි (2) ටොලමි (3) මහානාම හිමි (4) බුද්ධඝෝෂ හිමි

2. මහවැලි හා කැලණි ගංගා ආරම්භ වන කඳු ප්‍රදේශය කුමක් ද?
   (1) පිදුරුතලාගල (2) සමනොළ
   (3) නමුණුකුල (4) කිරිගල්පොත්ත

3. ඓතිහාසික වශයෙන් වැදගත් වූ කපොල්ලක් වන්නේ මින් කුමක් ද?
   (1) බලන (2) හඟුරන්කෙත (3) රුවන්වැල්ල (4) දඹුල්ල

4. තපස්සු සහ භල්ලුක නම් අශ්ව වෙළෙඳුන් දෙදෙනා විසින් ඉදිකරන ලදැයි සැලකෙන චෛත්‍යය කුමක් ද?
   (1) මහියංගන චෛත්‍යය (2) තිරියාය චෛත්‍යය
   (3) ථූපාරාම චෛත්‍යය (4) ජේතවන චෛත්‍යය

5. වාරි කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා ඉමහත් සේවාවක් කළ රජවරුන් අයත් පිළිතුර කුමක් ද?
   (1) විජය, වසභ, මහා පරාක්‍රමබාහු
   (2) වසභ, මහසෙන්, ධාතුසේන
   (3) මහා පරාක්‍රමබාහු, පළමුවන බුවනෙකබාහු, දෙවන පරාක්‍රමබාහු
   (4) විජය, මහසෙන්, වලගම්බා

6. චෝළ පාලනයෙන් රජරට මුදාගත් පාලකයා කවු ද?
   (1) පළමුවන විජයබාහු (2) පළමුවන පරාක්‍රමබාහු
   (3) නිශ්ශංකමල්ල (4) දෙවන පරාක්‍රමබාහු

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

7. 16 වන සියවස වනවිට යුරෝපා වෙළෙඳපොළේ ඉතා ඉහළ ඉල්ලුමක් තිබූ, ලංකාවේ කුළුබඩු වර්ගය කුමක් ද?
(1) කරාබුනැටි (2) කුරුඳු (3) ගම්මිරිස් (4) එනසාල්

8. ආරම්භයේ දී රෝම පාලකයින් ක්‍රිස්තියානි ධර්මය මර්දනය කිරීමට හේතුව කුමක් ද?
(1) පාලකයින් දෙවියන් ලෙස පෙනී සිටීම
(2) යුදෙව් ආගම අභාවයට යාම
(3) පූජකවරුන් පාලන කටයුතුවලට බාධාවක් වීම
(4) රෝම වැසියන් කිතු දහම ප්‍රතික්ෂේප කිරීම

9. සුවණ්ණ භූමිය ලෙස හැඳින්වූ රට කුමක් ද?
(1) තායිලන්තය (2) චීනය (3) ජපානය (4) බුරුමය

10. සෙන් බුදු දහමේ ආරම්භය සිදු වූ රට කුමක් ද?
(1) චීනය (2) ලාඕසය (3) කාම්බෝජය (4) තායිලන්තය

11. 1638 උඩරට-ලන්දේසි ගිවිසුම අත්සන් කළ රජතුමා නම් කරන්න.
(1) පළමුවන විමලධර්මසූරිය (2) පළමුවන රාජසිංහ
(3) දෙවන රාජසිංහ (4) දෙවන විමලධර්මසූරිය

12. දඹදෙණි යුගයේ රචිත ග්‍රන්ථයක් වන්නේ මින් කුමක් ද?
(1) පූජාවලිය (2) අමාවතුර
(3) සිංහල ජාතක පොත (4) ලෝවැඩ සඟරාව

13. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය දැරූ තෙරුණ් වහන්සේ කවු ද?
(1) මහා කාශ්‍යප (2) ආනන්ද
(3) උපාලි (4) මොග්ගලීපුත්ත තිස්ස

14. 'කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත' යන ගෞරව නාමයෙන් පිදුම් ලැබූ රජතුමා කවු ද?
(1) මහා විජයබාහු (2) දෙවන පරාක්‍රමබාහු
(3) තුන්වන විජයබාහු (4) හයවන පරාක්‍රමබාහු

15. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත්වූයේ කුමන ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ දී ද?
(1) ෆෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ්
(3) රොබට් බ්‍රවුන්රිග් (4) ටොරිංටන් සාමි

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

16. (1) පල්ලව (2) පාණ්ඩ්‍ය (3) චෝළ (4) මානවම්ම

17. (1) රුවන්වැලිසෑය (2) කිරිවෙහෙර (3) ගල්විහාරය (4) ආළාහන පිරිවෙන

18. (1) කෝට්ටේ (2) දෙවිනුවර (3) රයිගම (4) සීතාවක

19. (1) ගෝදාවරී නදී (2) ගෝණ නදී (3) මහා නදී (4) සින්ධු නදී

20. (1) සලපනාව (2) බිසෝකොටුව (3) ඇතුලුවාන (4) දේවතාකොටුව

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

2388

● අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම **නොගැළපෙන** නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) අසේල - එළාර
(2) වළගම්බා - සේන සහ ගුත්තික
(3) පරාක්‍රම පාණ්ඩ්‍ය - කාලිංග මාඝ
(4) දෙවන පරාක්‍රමබාහු - චන්ද්‍රබානු

22. (1) දුටුගැමුණු - ලෝවාමහාපාය
(2) මහසෙන් - ජේතවනාරාමය
(3) මහා පරාක්‍රමබාහු - මිරිසවැටිය
(4) නිශ්ශංකමල්ල - රන්කොත් වෙහෙර

23. (1) කව්සිළුමිණ - හතරවන පරාක්‍රමබාහු
(2) පූජාවලිය - බුද්ධ පුත්‍ර හිමි
(3) ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රිය හිමි
(4) කාව්‍යශේඛරය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

24. (1) මගධ - පාටලීපුත්‍ර
(2) කෝසල - ශ්‍රාවස්ති
(3) ගාන්ධාර - විශාලා
(4) කාසි - බරණැස

25. (1) බුරුමය - අනුරුද්ධ රජු
(2) සියම - සිරිධම්ම රජු
(3) කාම්බෝජය - ජයවර්මන් රජු
(4) චීනය - කණිෂ්ක රජු

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (*A*), (*B*), (*C*) හා (*D*) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

(*A*) සහ (*B*) පමණක් නිවැරදි නම්, අංක **1** ද,
(*B*) සහ (*C*) පමණක් නිවැරදි නම්, අංක **2** ද,
(*C*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **3** ද,
(*A*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **4** ද,

සලකුණු කරන්න.

26. මහාවංසය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – ලංකා ඉතිහාසය ඉගෙනීමේ දී ශ්‍රේෂ්ඨත ම මූලාශ්‍රය වීම
(*B*) – ඉන්දීය ඉතිහාසය ගොඩනැඟීමට ප්‍රයෝජනවත් දත්ත ඇතුළත් වීම
(*C*) – පැරණි ශ්‍රී ලංකාව පිළිබඳ සියලුම තොරතුරු ඇතුළත් කර තිබීම
(*D*) – අභයගිරි විහාරවාසී භික්ෂූන් පිළිබඳ තොරතුරු බහුල වීම

27. දඹදෙණි රාජ්‍ය සමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – වාරි කර්මාන්තය පදනම් කරගත් කෘෂි කර්මාන්තයට මුල්තැන හිමි වීම
(*B*) – දඹදෙණි රාජධානිය මුල්කරගනිමින් දිවයිනම එක්සත් වීම
(*C*) – දෙවන පරාක්‍රමබාහු රජුගේ පාලන මධ්‍යස්ථානය වීම
(*D*) – කාලිංග මාඝගෙන් පොලොන්නරුව නිදහස් කර ගැනීම

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

28. ලන්දේසින්ගේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) – කුල ක්‍රමය යොදා ගනිමින් ශ්‍රමය ලබා ගැනීම
   (B) – ඉන්දියානු ශ්‍රමිකයින් මෙරටට ගෙන්වීම
   (C) – තේ වගාව මෙරටට හඳුන්වා දීම
   (D) – සහල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මුතුරාජවෙල අස්වැද්දීම

29. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය නිවැරදි වේ ද?
   (A) – 1797 දී මුහුදුබඩ පළාත්වල බ්‍රිතාන්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවීම
   (B) – 1815 දී මුලු දිවයිනම බ්‍රිතාන්‍ය පාලනයට යටත් වීම
   (C) – 1910 දී ශ්‍රී ලාංකිකයින්ට සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීම
   (D) – ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කිරීම

30. සප්ත අපරිහාණී ධර්ම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) – මස් මාංශ අනුභවයෙන් වැළකී සිටීම
   (B) – නිතර නිතර රැස්වී සාකච්ඡා කිරීම
   (C) – සමගිව රැස්වීම හා සමගිව විසිර යාම
   (D) – තීරණ ගැනීමේදී සියලු දෙනාගේම එකඟත්වය ලබා ගැනීම

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් **X** හා **Y** තීරුවල ඇත. **Y** තීරුවේ ඇති නාම/ප්‍රකාශන **X** තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. **Y** තීරුවේ ඒවා **X** තීරුවේ අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| (1) සීබෝල්ඩ් ද වාර්ට් | A – ශ්‍රී වික්‍රමරාජසිංහ |
| (2) ජෝන් පීබස් | B – පළමුවන විමලධර්මසූරිය |
| (3) හියු බොයිඩ් | C – කීර්ති ශ්‍රී රාජසිංහ |
| (4) මැක්ඩෝවල් | D – රාජාධිරාජසිංහ |

(1) *A, C, B, D*  (2) *B, C, D, A*  (3) *C, D, A, B*  (4) *D, B, A, C*

32.

| X | Y |
|---|---|
| (1) මහාතිත්ථය | A – පලටුපාන |
| (2) පලුට්ඨගිරිය | B – මානාවුළු නුවර |
| (3) වාකිරිගල | C – මාතොට |
| (4) මහානාගහුල | D – වාතගිරි |

(1) *A, C, B, D*  (2) *B, D, C, A*  (3) *C, A, D, B*  (4) *D, B, A, C*

33.

| X | Y |
|---|---|
| (1) පළමුවන පරාක්‍රමබාහු | A – ගම්පල |
| (2) පළමුවන බුවනෙකබාහු | B – පොළොන්නරුව |
| (3) හතරවන බුවනෙකබාහු | C – යාපහුව |
| (4) හයවන පරාක්‍රමබාහු | D – කෝට්ටේ |

(1) *A, C, D, B*  (2) *B, C, A, D*  (3) *C, B, D, A*  (4) *D, A, B, C*



Department of Examinations Sri Lanka

34. X | Y

(1) ග්‍රීසිය — A – සින්දු නදිය

(2) රෝමය — B – ජාවා දූපත

(3) ඉන්දුනීසියාව — C – ඇතන්ස්

(4) ඉන්දියාව — D – ටයිබර් නදිය

(1) *A, C, B, D* (2) *B, C, A, D* (3) *C, D, B, A* (4) *D, A, B, C*

35. X | Y

(1) වීනස් — A – රණ ශූරයෙක්

(2) ඇලෙක්සැන්ඩර් — B – දෙවඟනක්

(3) සොක්‍රටීස් — C – නාට්‍යකරුවෙක්

(4) ඊස්කිලස් — D – දාර්ශනිකයෙක්

(1) *A, B, C, D* (2) *B, A, D, C* (3) *C, D, B, A* (4) *D, C, A, B*

● අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා, එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | පණ්ඩුකාභය රජු අභය නම් වූ සිය මාමා රත්තිරාජ්ජ තනතුරට පත් කළේ ය. | දේවානම්පියතිස්ස රජු විහාරමහාදේවි සරණපාවා ගත්තේ ය. |
| 37. | තෝපා, දුඹුටුලු හා එරමුදු වැව් ඒකාබද්ධ කර පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කර ඇත. | අඹන් ගඟේ ජලයෙන් පරාක්‍රම සමුද්‍රය පෝෂණය වී ඇත. |
| 38. | හික්කඩුවේ සුමංගල හිමි විසින් පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවන ලදී. | වී.බී. ජයා මහතා විසින් සහිරා විද්‍යාලය පිහිටුවන ලදී. |
| 39. | බෞද්ධ රටක් ලෙස සියමය අතීතයේ සිට ශ්‍රී ලංකාව සමග ආගමික සම්බන්ධතා පවත්වා ඇත. | ලංකාවෙන් සියමට බුදු පිළිමයක් ගෙන යන ලද අතර එහි හිමිකරු අගරජු වන බවට එරට වැසියන්ගේ විශ්වාසයක් විය. |
| 40. | රෝමය කුඩා රාජ්‍යයක් ලෙස ආරම්භව විශාල අධිරාජ්‍යයක් දක්වා වර්ධනය විය. | ග්‍රීසිය බලවත්වීම රෝම අධිරාජ්‍යයේ පරිහානියට හේතු විය. |

**

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**07 | S | I, II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (07) ඉතිහාසය - I, II

## ඉතිහාසය - II පත්‍රය

✻ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.


| | | |
|---|---|---|
| 1. කිරිඳි ඔය | 2. මාතොට | 3. පොළොන්නරුව |
| 4. කලුතර | 5. යාන්ඔය | 6. මහියංගනය |

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

● පහත දී ඇති ***A*** හා ***B*** රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) (අ) ***A*** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) එය පිහිටි ස්ථානය කුමක් ද?
(ඉ) මෙම ස්ථානයට ආසන්නතම නගරය කුමක් ද?


*(ලකුණු 03 යි)*



***A***

(iii) (අ) ***B*** වලින් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
(ආ) එය පිහිටා ඇත්තේ කොහේ ද?
(ඉ) එය භාවිත කළේ කුමක් සඳහා ද?

*(ලකුණු 03 යි)*



***B***

**2.** (i) දේවානම්පියතිස්ස රජු විසින් කරවූ බෞද්ධාගමික සිද්ධස්ථාන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) මහින්ද හිමියන් සමග පැමිණි දූත පිරිසෙන් හතරදෙනකු නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනය ස්ථාපිත කරලීම සඳහා මහින්ද හිමි විසින් සිදු කළ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**3.** (i) වසභ රජු පිළිබඳව තොරතුරු සපයන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) වසභ රජුගේ ආගමික සේවා දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) වසභ රජුගේ ආර්ථික සේවාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**4.** (i) පොළොන්නරුව රාජධානිය හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) චෝළයින් පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට හේතු දෙකක් ලියන්න. *(ලකුණු 04 යි)*

(iii) පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට මුල් වූ හේතු දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**5.** (i) උඩරැටියන් විසින් පෘතුගීසීන් පරාජය කළ සටන් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථකවීමට හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පෘතුගීසි පාලනයෙන් ශ්‍රී ලාංකික සමාජයට සිදු වූ බලපෑම් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**6.** (i) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ දේශපාලන පුනර්ජීවනයට නායකත්වය දුන් දෙදෙනකු නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බ්‍රිතාන්‍ය පාලනය හේතුකොට ගෙන මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට සංස්කෘතියට එකතු වූ නවාංග දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**7.** (i) රෝම අධිරාජයන් දෙදෙනකු නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) රෝම අධිරාජයන් සතු බලතල දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) රෝම ශිෂ්ටාචාරයෙන් අපට ලබාගත හැකි වටිනාකම් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

(i) ඉන්දියාවේ මෞර්ය යුගයේ කලා සහ ගෘහ නිර්මාණ ශිල්පය

(ii) ග්‍රීක යුගයේ සමාජය

(iii) ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා පුරා විද්‍යාත්මක මූලාශ්‍රවල ඇති වැදගත්කම

(iv) සොල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

*(ලකුණු 06 × 2 = 12 යි)*

* * *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka


**2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**II** වන පත්‍රයේ ප්‍රශ්න අංක **1** (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

**විභාග අංකය :** ..........................

**1** (i)




Department of Examinations Sri Lanka